ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

தேசிய பெறுகை ஆணைக்குழு

National Procurement Commission

කාර්යසාධන වාර්තාව - 2025

செயலாற்றுகை அறிக்கை – 2025

PERFORMANCE REPORT - 2025

අංක 44, ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 07

இல. 44, ஆர்.ஜி. சேனாநாயக்க மாவத்தை, கொழும்பு 07

No. 44, R.G. Senanayake Mawatha, Colombo 07

Telephone: 011-2665152, Fax: 011-2665162, Email: sg@nprocom.gov.lk

Website: www.nprocom.gov.lk

සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX ආ පරිච්ඡේදයේ 156ආ. (1) ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, 2023 මැයි 29 වන දින සිට සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156C. (1) ව්‍යවස්ථාවට අනුව, රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙනසුලු, තරගකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කර්තව්‍යය වන්නේ ය. රාජ්‍ය ප්‍රසම්පාදනයේ මූලධර්ම හා ආචාර ධර්මවලට අනුගත වන බව තහවුරු කිරීම සඳහා ද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව කැප වී සිටී.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කර්තව්‍ය සහ වගකීම් අතර, ප්‍රසම්පාදන උපමාන සහ පටිපාටි සකස් කිරීම, එකී උපමානවලට සහ ප්‍රශස්ථ පරිචයන්ට අනුකූලව, ප්‍රසම්පාදන අස්තිත්වයන්හි ප්‍රසම්පාදන කාර්යයන් සිදුවන බව තහවුරු කර ගැනීම පිණිස අධීක්ෂණය හා විමර්ශනය කිරීම, රජයේ ආයතනවල ප්‍රසම්පාදන ධාරිතාව ඇගයීම සහ රාජ්‍ය ප්‍රසම්පාදන පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

ඉහත දැක්වූ කර්තව්‍යයන්ට අනුකූලව කටයුතු කරමින්, 2025 වසර සඳහා වන මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි, සීමිත මානව හා භෞතික සම්පත් මධ්‍යයේ වුව ද, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව කැපී පෙනෙන ප්‍රතිඵල රැසක් අත්කර ගැනීමට සමත් වී ඇත. 2025 වසරේ දී අප ලද සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ, 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2024 භාෂා ත්‍රිත්වයෙන් ම නිකුත් කිරීමත්, ඊට සමගාමීව, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් ඊට අදාළ අත්පොත නිකුත් කිරීමත්, තෝරාගත් රාජ්‍ය නිලධාරීන් සඳහා එම මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා සාර්ථකව පැවැත්වීමත් ය.

උපදේශන සේවා පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය කෙටුම්පත් කිරීම ද 2025 වසරේ දී සම්පූර්ණ කරන ලද අතර, 2026 වර්ෂය තුළ එය නිකුත් කිරීමට අපේක්ෂිත ය. තවද, ඖෂධ සහ පරිභෝජනය කළ හැකි ස්වභාවයේ වෛද්‍ය උපකරණ පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ලබාගැනීම සඳහාත්, සත්‍යාපනය කිරීම සඳහාත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ වැඩමුළු පවත්වන ලදී. එපමණක් නොව, ප්‍රතිපත්ති සම්පාදන, අධීක්ෂණ සහ විමර්ශන කාර්යයන් නියමිත පරිදි නිම කරනු ලැබ ඇති අතර,ඒ යටතේ අදාළ නිරීක්ෂණ හා නිර්දේශ, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීමට ද කටයුතු කරන ලදී.

රාජ්‍ය අංශයේ ආයතනික ධාරිතාවන් සංවර්ධනය කිරීමේ අරමුණින්, දිවයින පුරා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්/වැඩමුළු මෙන්ම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ද මෙම වසර තුළ සාර්ථකව පවත්වන ලදී. දේශීය සහ ජාත්‍යන්තර උපදේශකයින්ගේ සහාය ලබාගෙන, ප්‍රසම්පාදන නීතිය කෙටුම්පත් කර සම්පූර්ණ කිරීමේ කාර්යය සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. රාජ්‍ය ප්‍රසම්පාදනයන් අධීක්ෂණය කිරීම පිළිබඳ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මාර්ගගත ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් (EPMS) හඳුන්වා දීමට ද කටයුතු කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ ඉල්ලීම පරිදි, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව සිය නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීම, කොමිෂන් සභාව විසින් මෙම වසර තුළ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. 2025 වසර තුළ අත්කර ගත් කාර්යසාධනය සහ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු මෙම කාර්යසාධන වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත.

අවසාන වශයෙන්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීම උදෙසා, මගේ සහෘද කොමිෂන් සභා සාමාජික භවතුන්, මහ ලේකම්තුමා, අධ්‍යක්ෂවරු සහ සෙසු සියලුම නිලධාරීන් දක්වන ලද අප්‍රතිහත කැපවීම හා සහයෝගය පිළිබඳව මාගේ කෘතඥතාව පළ කර සිටිමි.

සුධර්මා කරුණාරත්න,
සභාපතිනිය,
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

01.06.2026

පටුන

සභාපතිතුමියගේ පණිවිඩය 3
පටුන 4
01 වන පරිච්ඡේදය 6
ආයතනික පැතිකඩ / සංක්ෂිප්ත විශ්ලේෂණය 6
1.1 හැඳින්වීම 6
1.2 කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු 7
දැක්ම 7
මෙහෙවර 7
අරමුණු 7
1.3 ප්‍රමුඛ කර්තව්‍ය 7
1.4 ආයතනික ව්‍යුහය 9
1.5 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අංශ 10
1.5.1 පරිපාලන අංශය 10
1.5.2 ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය 10
1.5.3 ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය 11
1.5.4 ප්‍රසම්පාදන විමර්ශන අංශය 11
1.5.5 ගිණුම් අංශය 12
1.6 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතන / අරමුදල් 12
1.7 විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු 12
02 වන පරිච්ඡේදය 14
ප්‍රගතිය සහ ඉදිරි දැක්ම 14
2.1 විශේෂ ජයග්‍රහන, අභියෝග, සහ ඉදිරි ඉලක්ක 14
2.1.1 සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම් 14
2.1.2 සුවිශේෂී ජයග්‍රහණ 15
i. භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 16
ii. උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 16
iii. ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා මාර්ගෝපදේශ 16
iv. ඉඩම් බැහැර කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 17
v. රාජ්‍ය ප්‍රසම්පාදන පනත් කෙටුම්පත සකස් කිරීම 17
vii. කොන්ත්‍රාත් කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම 17
viii. අතිරේක ප්‍රතිපත්තිමය මුලපිරීම් 17
- සම්මත ලංසු ලේඛන (SBD) සම්පාදනය කිරීම සහ නිකුත් කිරීම සඳහා මූලික පියවර ගැනීම; 18

- රාමු ගිවිසුම, ජීවන චක්‍ර පිරිවැය ගණනය කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණ අංශය පිහිටුවීම ඇතුළු මාර්ගෝපදේශ සටහන් සකස් කිරීම සඳහා මුලපිරීම්; සහ 18
- ලංසුකරුවන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා මුලපිරීම්. 18

ix. පුහුණුව සහ ධාරිතා සංවර්ධනය 18

x. ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම 22

xi. ePMS සහායක කවුළුවක් පිහිටුවීම 23

xii. ePMS පිළිබඳ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 23

xiii. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 නිකුත් කිරීම 24

xiv. රජයේ ආයතන සහ අගතියට පත් පාර්ශ්වවල ගැටලු නිරාකරණය කිරීම 24

2.1.3 අභියෝග 24

03 වන පරිච්ඡේදය 27

සමස්ත මූල්‍ය කාර්යසාධනය 27

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 27

3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 28

3.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 29

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 31

3.5 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය 31

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 31

3.7 වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මඟින් ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 31

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 31

3.9 විගණකාධිපති වාර්තාව 32

4.1 කොමිෂන් සභාවේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වී ඇත) 41

05 වන පරිච්ඡේදය 44

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 44

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු 44

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග 44

06 වන පරිච්ඡේදය 47

මානව සම්පත් පැතිකඩ 47

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 47

6.2 මානව සම්පත් හිඟය කොමිෂන් සභාවේ කාර්යසාධනයට ඇති කරන බලපෑම 48

6.3 මානව සම්පත් සංවර්ධනය 49

දේශීය පුහුණු වැඩසටහන් 49

විදේශීය පුහුණු වැඩසටහන් 49

07 වන පරිච්ඡේදය 51

අනුකූලතා වාර්තාව 51

01 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / සංක්ෂිප්ත විශ්ලේෂණය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX ආ පරිච්ඡේදයේ 156ආ. (1) ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, 2023 මැයි 29 වන දින සිට සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156C. (1) ව්‍යවස්ථාවට අනුව, රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙනසුලු, තරගකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කර්තව්‍යය වන්නේ ය.

මෙම විධි නියෝගය ක්‍රියාවට නැංවීමෙහි ලා, රජයේ ආයතන සියල්ලට අදාළ වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ පටිපාටි සකස් කිරීම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ වගකීම වේ. ඊට අමතරව, මෙම ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාවලි අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම, ඒවායේ ප්‍රසම්පාදන ධාරිතාව ඇගැයීම සහ ආයතනික ප්‍රසම්පාදන හැකියාවන් ශක්තිමත් කිරීම වෙනුවෙන් ධාරිතා සංවර්ධන මුලපිරීම් සඳහා පහසුකම් සැපයීම කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබයි. තවද, රජයේ ආයතනවල ප්‍රසම්පාදන කාර්යසාධනය පිළිබඳව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අදාළ බලධාරීන් වෙත වාර්තා කරන අතර එමඟින් සමස්ත රජයේ ආයතනවල ස්ථාපිත මාර්ගෝපදේශ සහ පටිපාටි ඒකාකාරීවත්, ඵලදායී ලෙසත්, ක්‍රියාවට නැංවීම තහවුරු කෙරේ.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පහත නම් සඳහන් සාමාජික හවතුන් පස් (05) දෙනෙකුගෙන් සමන්විත වේ:

නම	තනතුර
සුධර්මා කරුණාරත්න මහත්මිය	සභාපතිනිය
අයිවන් තිසේරා මහතා	සාමාජික
ඩී.ඒ.පී.එස්. දරණාගම මහතා	සාමාජික
එස්. සුමන්දිරන් මහතා	සාමාජික
ආචාර්ය ඒ.ජී.පී. අසංග ගුණවංශ	සාමාජික

1.2 කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

ජාතික සංවර්ධනයට මං සලසන ප්‍රසම්පාදන පද්ධතියක්.

මෙහෙවර

රාජ්‍ය ප්‍රසම්පාදනයේ මුදලට සරිලන වටිනාකම තහවුරු කිරීම පිණිස, ප්‍රමිති ගත කිරීම, අධීක්ෂණය, විමර්ශනය සහ වාර්තා කිරීම තුළින් ප්‍රසම්පාදන පද්ධතිය ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා වන උපමාන සහ පටිපාටි සකස් කිරීම.

අරමුණු

- ප්‍රසම්පාදන මූලධර්ම තහවුරු කරමින් රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම.
- රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ පටිපාටි පිළිපැදීම තහවුරු කිරීම.
- ඵලදායී ප්‍රසම්පාදන අධීක්ෂණ සහ විමර්ශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.
- රට තුළ රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම.

1.3 ප්‍රමුඛ කර්තව්‍ය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ඇ (1) ව්‍යවස්ථාව ප්‍රකාර, පහත සඳහන් ප්‍රමුඛ කර්තව්‍ය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත පැවරී ඇත:

1. ප්‍රසම්පාදන මූලධර්මවලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීම පිණිස රජයේ ආයතන වෙනුවෙන් ප්‍රසම්පාදන පටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම;
2. පෙර අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම් මත පදනම් රජයේ ආයතන විසින් භාණ්ඩ, සේවා, වැඩ, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති සඳහා සියලුම ප්‍රසම්පාදන කටයුතු කරනු ලබන වන බව තහවුරු කිරීම පිණිස අධීක්ෂණ කටයුතු සිදුකර නිසි බලධාරීන්ට වාර්තා කිරීම;
3. භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා සුදුසුකම් ලත් සියලුම ලංසුකරුවන්ට ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගී වීමට සමාන අවස්ථාවක් ලබා දී ඇති බව තහවුරු කිරීම පිණිස අධීක්ෂණ කටයුතු සිදුකර නිසි බලධාරීන්ට වාර්තා කිරීම;
4. කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා වන කාර්ය පටිපාටි සාධාරණ හා විනිවිදභාවයෙන් යුක්ත වේද යන්න ඇගයීම පිණිස අධීක්ෂණ කටයුතු සිදුකර නිසි බලධාරීන්ට වාර්තා කිරීම;

5. ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටුවලට නියමිත සුදුසුකම් සහිත සාමාජිකයින් රජයේ ආයතන විසින් පත් කරනු ලබන බව තහවුරු කිරීම පිණිස එම සාමාජිකයන්ගේ සුදුසුකම් පිළිබඳව වාර්තා කිරීම;
6. ස්ථාපිත පටිපාටි සහ මාර්ගෝපදේශවලින් බැහැරව රජයේ ආයතන විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන පිළිබඳ වාර්තා විමර්ශනය කිරීම සහ එවැනි ප්‍රසම්පාදන සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම;
7. අඛණ්ඩ පුහුණුව තුළින් ප්‍රසම්පාදන පිළිබඳ රජයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම; සහ
8. රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ පටිපාටි පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.

1.4 ආයතනික ව්‍යුහය

2025 දෙසැම්බර් 31 වන දිනට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩල ව්‍යුහය පහත සංවිධානාත්මක සටහනෙන් නිරූපණය කෙරේ.



** 2025.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යා පදනම් කර සකසා ඇත.*

1.5 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අංශ

කොමිෂන් සභාව යටතේ පහත දැක්වෙන අංශ පහ (05) ක්‍රියාත්මක වේ:

1. පරිපාලන අංශය;
2. ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය;
3. ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය;
4. ප්‍රසම්පාදන විමර්ශන අංශය; සහ
5. ගිණුම් අංශය.

1.5.1 පරිපාලන අංශය

ආයතනික කටයුතු අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකියන පරිපාලන අංශය, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූලික කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සෙසු අංශවලට සහාය වේ. ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, පාර්ලිමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු ඉටු කරන කොමිෂන් සභාවේ ප්‍රාථමික සම්බන්ධීකරණ ඒකකය ලෙස මෙම අංශය සේවය කරයි.

තවද, පරිපාලන හා ආයතනික කටයුතු සමාලෝචනය කර අදාළ වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම නියමිත වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද මෙම අංශයට පැවරී ඇති කාර්යයන් වේ. අධ්‍යක්ෂ (පරිපාලන) ප්‍රධානියා ලෙස කටයුතු කරන මෙම අංශයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී ඇය විසින් අවශ්‍ය උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම සපයනු ලැබේ.

1.5.2 ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය

ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය, රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, උපමාන, පටිපාටි, සහ ප්‍රමිති මෙන්ම ඒවාට අදාළ ක්‍රියාත්මක කිරීමේ රාමු සැලසුම් කිරීම සහ සකස් කිරීම පිළිබඳ වගකීම උසුලයි. රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළ ප්‍රතිපත්තිමය උපදෙස්, ප්‍රසම්පාදන මූලධර්ම සහ ජාතික අවශ්‍යතා සමඟ සමපාත වන බව තහවුරු කරමින් මෙම අංශය, ප්‍රතිපත්ති ආශ්‍රිත කරුණු පිළිබඳව කොමිෂන් සභාවට නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීම සිදු කරයි.

මීට අමතරව, රාජ්‍ය අංශය පුරා අනුකූලතා සහ ප්‍රසම්පාදන විශිෂ්ටත්වයේ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අරමුණින්, රාජ්‍ය ආයතන ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන්, පුහුණු මුලපිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම මෙම අංශය විසින් මෙහෙයවයි. අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට යොමු කරනු ලබන රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ පටිපාටිවලට අදාළ කැබිනට් සංදේශ පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ අඩංගු පුළුල් වාර්තා සකස් කිරීම මෙම අංශයට පැවරී ඇති තවත් කාර්යයකි. රජයේ ආයතන විසින් මතු කරන ලද ප්‍රසම්පාදන ආශ්‍රිත කරුණු

පිළිබඳව ප්‍රතිපත්ති පැහැදිලි කිරීම්, විශේෂඥ උපදෙස් සහ අදහස් ලබා දීම සඳහා බලයලත් ඒකකය ලෙස ද මෙම අංශය ක්‍රියා කරයි.

අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතර, මෙම අංශයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී ඔහු විසින් අවශ්‍ය උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම ලබා දෙනු ලැබේ.

1.5.3 ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය

රාජ්‍ය ආයතන විසින්, පෙර අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූල වන ප්‍රසම්පාදන සැලසුම් දැඩි ලෙස පිළිපදිමින් භාණ්ඩ, වැඩ, සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය සිදු කරනු ලබන බව තහවුරු කිරීම පිණිස එම ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ වගකීම වේ. මෙම අංශය කොමිෂන් සභාව සහ අනෙකුත් අදාළ බලධාරීන් වෙත එහි නිගමන ක්‍රමානුකූලව ලේඛනගත කර වාර්තා කරන අතර, රාජ්‍ය ප්‍රසම්පාදනයේ විනිවිදභාවය සහ වගවීම, එමඟින් ප්‍රවර්ධනය කෙරේ.

ඊට අමතරව, සියලුම රාජ්‍ය ආයතන ඇතුළත් පුළුල් ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් (ePMS) සැලසුම් කිරීම, ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම අංශය වෙත පැවරී ඇත. ස්ථාපිත ප්‍රසම්පාදන පටිපාටි සහ නියාමන රාමුවලට කොතරම් දුරට අනුකූලව ප්‍රසම්පාදන අස්තිත්ව ක්‍රියා කරන්නේ ද යන්න මෙම අංශය තවදුරටත් අධීක්ෂණය කර ඇගයීමට ලක් කරයි. අධ්‍යක්ෂ (අධීක්ෂණ) මෙම අංශයේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරන අතර, මෙම අංශයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී අවශ්‍ය උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම ඔහු විසින් ලබා දෙනු ලැබේ.

1.5.4 ප්‍රසම්පාදන විමර්ශන අංශය

ස්ථාපිත පටිපාටි සහ මාර්ගෝපදේශවලින් බැහැරව රජයේ ආයතන විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන පිළිබඳ වාර්තා විමර්ශනය කිරීම සහ කොමිෂන් සභාවේ නියමය පරිදි, එවැනි ප්‍රසම්පාදන සඳහා වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම ප්‍රසම්පාදන විමර්ශන අංශය සතු වගකීමකි. කරුණු සෙවීමේ විමර්ශන සහ සවිස්තරාත්මක විමර්ශන යන කාණ්ඩ දෙකක් යටතේ විමර්ශන පවත්වනු ලැබේ. පැමිණිල්ලේ සපයා ඇති තොරතුරු මත පදනම්ව, අදාළ අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්තිත්වයෙන් ලබාගත් වාර්තා සහ ලේඛන සමඟ කරුණු සෙවීමේ විමර්ශන ආරම්භ කරනු ලැබේ. ගැටලුවේ ස්වභාවය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සංකීර්ණතාවය මත පදනම්ව, ලංසුකරුවන් විසින් සපයන ලද ලංසු ඉදිරිපත් කිරීම් ඇතුළුව අදාළ සියලුම ලියකියවිලි පිළිබඳ පුළුල් හා ගැඹුරු සමාලෝචනයක් ඇතුළත් සවිස්තරාත්මක විමර්ශනයක් සිදු කරනු ලැබේ. සවිස්තරාත්මක විමර්ශනවල අරමුණ වන්නේ, ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් සිදුවන බව තහවුරු කිරීම යි.

අවශ්‍ය ලියකියවිලි සමඟ විස්තීරණ වාර්තා හරහා මෙම අංශය තම නිගමන සලකා බැලීම පිණිස කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. ස්ථාපිත පටිපාටිවලින් බැහැරව සිදු කරන ලද ප්‍රසම්පාදනවලට අදාළ නිරීක්ෂණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් සහ අනෙකුත් සුදුසු බලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ.

ඊට අමතරව, මෙම අංශයේ වගකීමක් වන්නේ, ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නිලධාරීන් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීම යි. එවැනි අවස්ථා පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත වහාම වාර්තා කරනු ලැබේ.

අංශයේ ප්‍රධානියා ලෙස අධ්‍යක්ෂ (විමර්ශන) ක්‍රියා කරන අතර, මෙම අංශයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී අවශ්‍ය උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම ඔහු විසින් ලබා දෙනු ලැබේ.

1.5.5 ගිණුම් අංශය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලයේ සියලුම මූල්‍ය, ගිණුම්කරණ කටයුතු සහ වත්කම් කළමනාකරණය අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම ගිණුම් අංශය සතු වගකීමයි. මූල්‍ය වාර්තා නිවැරදිව පවත්වා ගැනීම, ස්ථාපිත මූල්‍ය රෙගුලාසි පිළිබඳ අනුකූලතාව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ කොමිෂන් සභාවේ මූල්‍ය සම්පත් නිසි ලෙස කළමනාකරණය කෙරෙන බව මෙම අංශය තහවුරු කරයි. ගණකාධිකාරීවරයාගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වන මෙම අංශය වෙත පැවරී ඇති කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේදී අවශ්‍ය උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම ඔහු විසින් ලබා දෙනු ලැබේ.

1.6 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතන / අරමුදල්

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව යටතේ කිසිදු ආයතනයක් හෝ අරමුදල් ක්‍රියාත්මක නොවේ. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට අරමුදල් ලැබෙන්නේ ඒකාබද්ධ අරමුදල හරහා පමණි. කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සඳහා අරමුදල් වාර්ෂික ඇස්තමේන්තුවේ විශේෂ නෛතික ප්‍රතිපාදන යටතේ සපයනු ලැබේ.

1.7 විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව යටතේ විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති නොමැත. එතකුදු වුවත්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ඇතිව ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරයි. මෙම හවුල්කාරිත්වයේ ආරම්භක අදියරේ එක් අංගයක් ලෙස, UNDP ආයතනය විසින් ඩෙස්ක්ටොප් පරිගණක 13 ක්, නෝට්බුක් පරිගණක 12 ක්, ඉහළ

කාර්යසාධනයක් සහිත බහුකාර්ය කාර්යාල මුද්‍රණ යන්ත්‍රයක් සහ බහුකාර්ය ජාල මුද්‍රණ යන්ත්‍ර 2 ක් ඇතුළුව අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ උපකරණ සහ යටිතල පහසුකම් සපයන ලදී. ඊට අමතරව, වසර පුරා ePMS පද්ධතිය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ ධාරිතා සංවර්ධන සහාය ලබා දීමට ද UNDP ආයතනය කැපවී සිටී.

ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියේ ආරම්භක සංවර්ධන අදියරේදී ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ප්‍රසම්පාදන අධීක්ෂණය නවීකරණය කිරීම සහ ස්වයංක්‍රීය කිරීම සඳහා මෙම පද්ධතිය නිර්මාණය කර ඇති අතර, වත්මන් කඩදාසි පාදක අධීක්ෂණ ක්‍රමවේදයෙන් විතැන්වී ඒකාබද්ධ ඩිජිටල් රාමුවකට මාරුවීමට එමඟින් පහසුකම් සලසයි. දියුණු, අන්තර්ක්‍රියාකාරී වෙබ් පාදක වේදිකාවක් ලෙස සංවර්ධනය කරන ලද මෙම පද්ධතිය 2026 වසරේ දී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

එපමණක් නොව, ආසියානු සංවර්ධන බැංකුව (ADB) රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා නොමසුරුව සහාය වූ අතර, එමඟින් රජයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු පහසුකම් සහ ධාරිතා සංවර්ධන අවස්ථා සලසා දීමට හැකි විය.

02 වන පරිච්ඡේදය

ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහන, අභියෝග, සහ ඉදිරි ඉලක්ක

2.1.1 සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ, සෑම සතියකටම වරක් නිතිපතා පැවැත්වූ රැස්වීම් 45 ක් ඇතුළුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අවස්ථා ගණනාවකදී රැස්වූ අතර, එහිදී කරුණු රාශියක් පිළිබඳව සාකච්ඡා කොට, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ ප්‍රසම්පාදන කරුණු සම්බන්ධයෙන් නියෝග නිකුත් කිරීම සිදු කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ, කොමිෂන් සභා පත්‍රිකා 150 ක් සහ එකඟතා, පැහැදිලි කිරීම්, උපදෙස් සහ මත පළකිරීම් වලට අදාළ කරුණු 520 ක් කොමිෂන් සභාව විසින් සලකා බලන ලදී.

ප්‍රසම්පාදනයට අදාළ කරුණු සහ ප්‍රසම්පාදන පටිපාටි වැඩිදියුණු කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විවිධ රාජ්‍ය ආයතන, අරමුදල් සපයන ආයතන සහ වෘත්තීය සංගම් සමඟ රැස්වීම් පැවැත්වීය.

රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම උද්දීපනය කිරීම සඳහා, ජාතික, පළාත් සහ ආයතනික මට්ටමින් අඛණ්ඩ පුහුණුවක් ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් වසර පුරා පවත්වන ලදී.

තවද, භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ කෙටුම්පත සම්බන්ධයෙන් අදහස්, මත සහ යෝජනා ලබා ගැනීම සඳහා කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, අරමුදල් සපයන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පාර්ශ්වකරුවන් සඳහා විශේෂ උපදේශන වැඩසටහන් හතරක් (04) පවත්වන ලදී. ඉන් අනතුරුව, වැඩිදියුණු කළ මාර්ගෝපදේශ කෙටුම්පත පිළිබඳ අවසන් එකඟතාවට එළඹීම සඳහා ප්‍රමුඛ පාර්ශ්වකරුවන් සමඟ වලංගු කිරීමේ වැඩසටහන් දෙකක් (02) පවත්වන ලදී. භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 නිකුත් කිරීමෙන් පසු, එම මාර්ගෝපදේශවලට දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා ජාතික, පළාත් සහ ආයතනික මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් ද පවත්වන ලදී.

එපමණක් නොව, පවතින කාර්යාල ගොඩනැගිල්ලට අලුතින් කොටසක් එක් කිරීම සහ එම කාර්යාල ගොඩනැගිල්ලට යාබදව පිහිටි රජයේ ගොඩනැගිල්ල ලබා ගැනීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම ඇතුළු භෞතික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ද 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ අතර, කාර්යාල අවකාශ සීමිත වීම මත කොමිෂන් සභාව දැඩිව පීඩාවිඳින ගැටලුව විසඳා ගැනීමට එමඟින් හැකි වේ.

01 වන වගුව

2025 වසරේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් පවත්වන ලද රැස්වීම් සහ වැඩමුළු

මාසය	කොමිෂන් සභා රැස්වීම්	ආයතන සමඟ පැවැත්වූ රැස්වීම්	වැඩමුළු	එකතුව
ජනවාරි	04	07	05	16
පෙබරවාරි	02	04	03	09
මාර්තු	04	07	02	13
අප්‍රේල්	04	02	02	08
මැයි	05	07	-	12
ජුනි	04	05	01	10
ජූලි	04	11	01	16
අගෝස්තු	04	14	01	19
සැප්තැම්බර්	04	05	-	09
ඔක්තෝබර්	04	10	02	16
නොවැම්බර්	03	03	03	09
දෙසැම්බර්	03	01	-	04
සමස්ත එකතුව	**45**	**76**	**20**	**141**

ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සම්පාදනයේ උන්නතිය, ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයතනවල දැනුම සහ මනා ප්‍රසම්පාදන පරිචයන් වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන් සැලකිය යුතු දායකත්වයක් සැපයීය. කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිතව පැවරී ඇති කාර්යභාරයට අනුකූලව මෙම මුලපිරීම් තිරසර ලෙස පවත්වා ගැනීමටත්, ඒවා වඩාත් පුළුල් කිරීමටත් කොමිෂන් සභාව කැපවී සිටී.

2.1.2 සුවිශේෂී ජයග්‍රහණ

2025 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රතිපත්ති සහ මෙහෙයුම් මූලාරම්භයන් සාර්ථකව සිදු කරන ලදී:

i. භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024

භාණ්ඩ සහ වැඩ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ප්‍රකාශයට පත් කිරීමෙන් වසර 19 කට පසු, 2025 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කිරීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට හැකි විය. ඊට සමගාමීව, අදාළ ප්‍රසම්පාදන අත්පොත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලින් ද ප්‍රකාශයට පත් කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ අත්පොතේ දෙමළ අනුවාදය කෙටුම්පත් කිරීම ද ආරම්භ කරන ලදී.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී, ප්‍රසම්පාදන අස්තිත්ව විසින් මතු කරන ලද ගැටලු පිළිබඳව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පැහැදිලි කිරීම් සිදු කළේය. මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින්, ප්‍රසම්පාදන කළමනාකරණ අංශ, පිළිගැනීමේ කමිටු, විචල්‍ය සමාලෝචන කමිටු සහ අභියාචනා කමිටු පිහිටුවීම ඇතුළු නව විධිවිධාන සහ ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දෙන ලදී. තවද, අභියාචනා, සම්බාධක, තහනම් කිරීම සහ අසාදු ලේඛනගත කිරීම සඳහා නව කාර්ය පටිපාටි හඳුන්වා දීම ද, ඊට අමතරව, රාමු ගිවිසුම සඳහා වන විධිවිධාන නව කොන්ත්‍රාත් විධිවිධානයක් ලෙස මාර්ගෝපදේශවලට ඇතුළත් කිරීම ද සිදුකරන ලදී. තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය, ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදනය සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය සඳහා වන විධිවිධාන මාර්ගෝපදේශවලට හඳුන්වා දුන් නව මුලපිරීම් අතර වේ.

ii. උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

වර්ෂ 2007 දී ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය විසින් උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳව දැනට බලාත්මක මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශ 2007 සිට නොවෙනස්ව පැවති අතර ඒවා වැඩිදියුණු කිරීමක් හෝ සිදුව නොමැත. එම තත්ත්වය යටතේ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සැලකිය යුතු ජයග්‍රහණයක් සනිටුහන් කරමින්, වර්තමාන ප්‍රවණතා සහ ගෝලීය වශයෙන් අවධානයට යොමුව ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ද, පවතින මාර්ගෝපදේශවල හඳුනාගත් හිඩැස් පුරවමින් ද, උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල පළමු කෙටුම්පත සකස් කළේය. ඊට සමගාමීව, සවිස්තර අත්පොතක් ද කෙටුම්පත් කරමින් පවතී. තවද, උපදේශන සේවා සඳහා නව සම්මත ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක් සම්පාදනය කිරීමට ද මුලපුරණ ලදී.

iii. ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා මාර්ගෝපදේශ

2022 දී නිකුත් කරන ලදුව, මේ දක්වා බලාත්මකව පවතින ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ මඟින් ඖෂධ සහ වෛද්‍ය උපකරණ බාධාවකින් තොරව, අඛණ්ඩව සපයා ගැනීම ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර නොමැත. මෙම තත්වය යටතේ, 2024 වසරේ දී ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව, නව මාර්ගෝපදේශ හඳුන්වා දීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මූලිකත්වය

ගෙන ක්‍රියා කළේය. 2025 වර්ෂය තුළ, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයුම් අංශ, ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය, රාජ්‍ය ඖෂධ සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ අරමුදල් සපයන ආයතන ඇතුළු සෞඛ්‍ය අංශයේ ප්‍රමුඛ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් උපදේශන වැඩමුළු පවත්වන ලදී.

iv. ඉඩම් බැහැර කිරීම පිළිබඳ මාර්ගෝපදේශ

අමාත්‍ය මණ්ඩලයේ ඉල්ලීම මත, සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් බැහැර කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මූලිකත්වය ක්‍රියා කළේය.

v. රාජ්‍ය ප්‍රසම්පාදන පනත් කෙටුම්පත සකස් කිරීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ පැවති සාකච්ඡාවලදී ශ්‍රී ලංකා රජය ඉටු කිරීමට එකඟ වූ කරුණුවලට අනුකූලව, රාජ්‍ය ප්‍රසම්පාදන පනත් කෙටුම්පත සකස් කිරීමේ වගකීම මුදල් අමාත්‍යාංශය විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට පවරන ලදී.

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික සහ මූල්‍ය සහාය මත, මෙම නීති සම්පාදන කාර්යය සඳහා සුදුසුකම් ලත් දේශීය සහ ජාත්‍යන්තර උපදේශකයින්ගේ සේවය සලසා ගන්නා ලදී. ඒ අනුව, රාජ්‍ය ප්‍රසම්පාදන නීතිය පිළිබඳ පනත් කෙටුම්පත සකස් කරන ලද අතර, එම කෙටුම්පත පාර්ලිමේන්තුවට විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට පෙරාතුව, කෙටුම්පත සමාලෝචනය කර, අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර, කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් කිරීමේ අරමුණින්, කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, අරමුදල් සපයන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පාර්ශ්වකරුවන්ගේ අදහස් දැක්වීම්, නිරීක්ෂණ සහ යෝජනා ලබා ගැනීම සඳහා ඔවුන් සමඟ ව්‍යුහගත උපදේශන වැඩසටහන් පවත්වන ලදී.

vii. කොන්ත්‍රාත් කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම

කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මූලික පියවර ගෙන ඇති අතර, 2025 දී උපදේශකයින් විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත සමාලෝචනය කිරීමට තවදුරටත් ක්‍රියාකර ඇත.

viii. අතිරේක ප්‍රතිපත්තිමය මුලපිරීම්

- භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 පළාත් සභාවලට අදාළකර ගැනීම සඳහා එකඟතාව ලබා දෙන ලදී;

- සම්මත ලංසු ලේඛන (SBD) සම්පාදනය කිරීම සහ නිකුත් කිරීම සඳහා මූලික පියවර ගැනීම;
- රාමු ගිවිසුම, ජීවන චක්‍ර පිරිවැය ගණනය කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණ අංශය පිහිටුවීම ඇතුළු මාර්ගෝපදේශ සටහන් සකස් කිරීම සඳහා මුලපිරීම්; සහ
- ලංසුකරුවන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා මුලපිරීම්.

ix. පුහුණුව සහ ධාරිතා සංවර්ධනය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ ප්‍රසම්පාදන මූලධර්ම සහ පටිපාටිවලට අනුකූල වීම තහවුරු කිරීම යන මූලික අරමුණු පෙරදැරිව, විස්තීර්ණ පුහුණු සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට කැපවී සිටී. කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන කරුණු තුළින් ප්‍රතිපත්ති, අධීක්ෂණ සහ විමර්ශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමූහිකව පුහුණු අවශ්‍යතා පොදුවේ හඳුනා ගනු ලබන අතර, එම අවශ්‍යතා පිළිබඳව සුදුසු පුහුණු සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පසුව සැලසුම් කිරීම සහ පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) වෙත යොමු කරනු ලැබේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් පුහුණු ආධාරක සංවර්ධනය කරන ලද අතර, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව, පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් මාලාවක් නිර්මාණය කරන ලද අතර, සියලු පළාත් සහ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිවයින පුරා වැඩසටහන් හතරක් (04) මෙම වසර තුළ පවත්වන ලදී.

භාණ්ඩ, වැඩ, හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 පිළිබඳව පැවැත් වූ වැඩසටහන්

අංක	වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම	සහභාගී සංඛ්‍යාව	දිනය
01	භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024 පිළිබඳ හැඳින්වීම	උතුරු මැද පළාත් සභාවේ, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ උතුරු මැද පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්		15.01.2025
02	-එම-	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ බස්නාහිර පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		17.01.2025

03	-එම-	දකුණු පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ දකුණු පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		28.01.2025
04	-එම-	ඌව පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ ඌව පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		10.02.2025
05	-එම-	මධ්‍යම පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ මධ්‍යම පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		18.02.2025
06	-එම-	වයඹ පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ වයඹ පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		24.02.2025
07	-එම-	නැගෙනහිර පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ නැගෙනහිර පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		04.03.2025
08	-එම-	සබරගමුව පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්		18.03.2025

		සහ සබරගමුව පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		
09	-එම-	උතුරු පළාත් සභාවේ නිලධාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ උතුරු පළාතේ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්.		08.04.2025
10	2024 නව මාර්ගෝපදේශ මත පදනම් වූ රාජ්‍ය ප්‍රසම්පාදන පිළිබඳ දැනුම්වත් කිරීම	මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්		29.07.2025
11	-එම-	කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		
12	-එම-	අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		01.08.2025
13	-එම-	වැවිලි කර්මාන්ත හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		15.08.2025
14	-එම-	අධ්‍යාපන කර්මාන්ත හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		15.08.2025
15	-එම-	ගම්පහ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		09.09.2025

16	-එම-	තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		17.09.2025
17	-එම-	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		01.02.2025
18	ජනාධිපත් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු	ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන් සහ තෝරාගත් අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිළධාරින්		15.06.2025
පැවැත්වූ මුළු වැඩසටහන් සංඛ්‍යාව : 17				

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් - 2025

අංක	ස්ථානය	පළාත	දින
01	නුවරඑළිය	මධ්‍යම පළාත	ඔක්තෝබර් 09 — 10, 2025
02	හබරණ	උතුරු මැද පළාත	නොවැම්බර් 10 — 11, 2025
03	කළුතර	බස්නාහිර පළාත	නොවැම්බර් 17 — 18, 2025
04	ත්‍රිකුණාමලය	නැගෙනහිර පළාත	නොවැම්බර් 24 — 25, 2025
පැවැත්වූ මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව : 04			

සමස්ත පුහුණු ක්‍රියාකාරකම් සාරාංශය

වැඩසටහන් වර්ගය	වැඩසටහන් ගණන
2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්	16

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්	04
එකතුව	**20**

x. ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

2025 වර්ෂය තුළ, අතින් ක්‍රියාත්මක කළ ප්‍රසම්පාදන අධීක්ෂණ කටයුතු නියමු ව්‍යාපෘතියක් ලෙස ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) හරහා ක්‍රියාත්මක කිරීම වෙත විතැන් වීම කෙරෙහි අධීක්ෂණ අංශයේ මූලික අවධානය යොමු විය. මෙම උපායමාර්ගික සංක්‍රාන්තිය රාජ්‍ය ප්‍රසම්පාදන අධීක්ෂණ කටයුතුවල විනිවිදභාවය, වගවීම, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ශක්තිමත් කිරීමේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ මූලික සාකච්ඡාවලින් පසුව, UNDP ආයතනය විසින් ePMS පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී. මොරටුව විශ්ව විද්‍යාලය හරහා තොරතුරු තාක්ෂණ උපදේශකයෙකු සහ පද්ධති සංවර්ධකයෙකු කොමිෂන් සභාවට ලබාදීමට UNDP ආයතනය කටයුතු කළේය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) හරහා epms.nprocom.gov.lk යන නිල වෙබ් අඩවිය ලියාපදිංචි කරන ලද අතර, ePMS පද්ධතිය 2025 සැප්තැම්බර් මාසයේ දී ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී. ආරම්භයේ දී, නියමු වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වූ ePMS පද්ධතිය අමාත්‍යාංශ විසිපහක් (25) සහ විශේෂ වියදම් ඒකක විසි එකක් (21) සඳහා හඳුන්වා දෙන ලදී.

1 වන වගුව - 2025 වසරේ පවත්වන ලද වැඩසටහන

අංක	දිනය	පුහුණු වැඩසටහන	ඉලක්ක ගත කණ්ඩායම	සහභාගී වූ සංඛ්‍යාව
01	12.03.2025	UNDP ප්‍රධාන කාර්යාලයේ පැවති ePMS පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	ජා.ප්‍ර.කො. නිලධාරීන් හා කාර්ය මණ්ඩලය	13
02	13.06.2025	ePMS පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	ප්‍රසම්පාදන කටයුතුවල නියුතු අමාත්‍යාංශ නිලධාරීන් (I කොටස — අමාත්‍යාංශ 12)	56

03	20.06.2025	ePMS පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	ප්‍රසම්පාදන කටයුතුවල නියුතු අමාත්‍යාංශ නිලධාරීන් (II කොටස - ඉතිරි අමාත්‍යාංශ 12)	58
04	09.07.2025	ePMS පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	ප්‍රසම්පාදන කටයුතුවල නියුතු විශේෂ වියදම් ඒකකවල නිලධාරීන්	58
05	09.09.2025	ePMS පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	අමාත්‍යාංශ හා විශේෂ වියදම් ඒකකවල නම්කළ කේන්ද්‍රීය නිලධාරීන්	48

xi. ePMS සහායක කවුළුවක් පිහිටුවීම

නියමු ව්‍යාපෘතියට සහභාගී වන ආයතන සඳහා අඛණ්ඩ තාක්ෂණික සහ මෙහෙයුම් සහාය ලබා දීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලයේ ePMS සහායක කවුළුවක් ස්ථාපිත කරන ලද අතර එම කවුළුව මඟින් පද්ධති ආශ්‍රිත තාක්ෂණික ගැටලු විසඳීම, කාර්ය ප්‍රවාහ පටිපාටි පැහැදිලි කිරීම, පිවිසුම් නිර්මාණය සඳහා සහාය වීම, මුරපද කළමනාකරණය සහ දත්ත ඇතුළත් කිරීම පිළිබඳ මග පෙන්වීම සඳහා පහසුකම් සපයයි. වැඩසටහනේ නියමු දියත් කිරීමෙන් පසුව, නියමු ව්‍යාපෘතියට සහභාගී වන ආයතනවලින් 200 කට අධික සහාය ඉල්ලීම් සංඛ්‍යාවක් සහායක කවුළුව වෙත ලැබුණි.

xii. ePMS පිළිබඳ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

2025 සැප්තැම්බර් 16 වන දින ePMS නියමු ව්‍යාපෘතිය දියත් කරන ලදී. අමාත්‍යාංශ 24 ක් සහ විශේෂ වියදම් ඒකක 21 ක් පද්ධතියට ඇතුළත් කරන ලදී. නියමු අදියරට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP) ඉදිරිපත් කිරීම, වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම (APPP) ඉදිරිපත් කිරීම, සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (DAPP) ඉදිරිපත් කිරීම සහ පද්ධතිය හරහා කාර්ය ප්‍රවාහ අනුමත කිරීම් ඇතුළත් විය.

2 වන වගුව - 2025.12.31 දිනට නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

අ/අ	විස්තරය	ආයතන සංඛ්‍යාව
01	ව්‍යාපෘතියට ඇතුළත් වූ මුළු අමාත්‍යාංශ ගණන	24
02	ව්‍යාපෘතියට ඇතුළත් වූ මුළු විශේෂ ව්‍යාපෘති ඒකක ගණන	21

03	සවිස්තර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අවසන් කළ අමාත්‍යාංශ ගණන (ක්‍රියාවලියේ ආරම්භක සන්ධිස්ථානය)	02
04	සවිස්තර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අවසන් කළ විශේෂ ව්‍යාපෘති ඒකක ගණන (ක්‍රියාවලියේ ආරම්භක සන්ධිස්ථානය)	08
05	දැනට එම කටයුත්ත සම්පූර්ණ කරමින් සිටින අමාත්‍යාංශ ගණන	22
06	දැනට එම කටයුත්ත සම්පූර්ණ කරමින් සිටින විශේෂ ව්‍යාපෘති ඒකක ගණන	13

xiii. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 නිකුත් කිරීම

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් අංක 01/2025 හා 2025 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද අතර, එමගින් 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම සියලු රජයේ ආයතනවලට අනිවාර්ය කරන ලදී.

xiv. රජයේ ආයතන සහ අගතියට පත් පාර්ශ්වවල ගැටලු නිරාකරණය කිරීම

ප්‍රසම්පාදන අස්තිත්ව විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, අත්පොත් සහ අනෙකුත් අදාළ ලියකියවිලිවල නියම කර ඇති විධිවිධානවලින් බැහැර වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලංසුකරුවන්, විභව ලංසුකරුවන් සහ සෙසු පාර්ශ්වකරුවන්ගෙන් ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන විමර්ශන අංශය විමර්ශන පැවැත්වීය.

2025 වසර තුළ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කරන ලද මුළු පැමිණිලි 135 ක් ප්‍රසම්පාදන විමර්ශන අංශය විසින් මෙහෙයවන ලදී. පැමිණිලි අසූ හතක් (87) සඳහා කරුණු සෙවීමේ පරීක්ෂණ කටයුතු අවසන් කරන ලද අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග සහ අනුකූලතාව සඳහා කොමිෂන් සභාවේ තීරණ අදාළ පාර්ශ්වවලට දැනුම් දෙන ලදී. ඉතිරි පැමිණිලි හතළිස් අට (48) සඳහා අදාළ විස්තර සහ ලියකියවිලි අදාළ අමාත්‍යාංශවලින් ඉල්ලා ඇති අතර, මෙම පැමිණිලි 2025 දෙසැම්බර් 31 වන දින වන විට විමර්ශනයට ලක් කෙරෙමින් පැවතුණි.

2.1.3 අභියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීමේදී සැලකිය යුතු අභියෝග රැසකට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මුහුණ දෙයි:

- අනුමත කාර්ය මණ්ඩලයට නිලධාරීන් බඳවා ගැනීමේ දුෂ්කරතාව: අනුමත කාර්ය මණ්ඩල තනතුරු 60ක් තිබෙන නමුත්, 2025 වසර අවසානය වන විට පුරප්පාඩු 30ක් තවදුරටත් පුරප්පාඩුව පවතී. මෙම හිඟය කොමිෂන් සභාවේ කාර්යසාධනය අවහිර කරන ප්‍රධාන අභියෝගවලින් එකකි.
- අනුමත කාර්ය මණ්ඩලයේ විධායක තනතුරුවල පුරප්පාඩු පිරවීමට අපොහොසත් වීම: විධායක තනතුරු පිරවීමට නොහැකි වීම ද සැලකිය යුතු අභියෝගයක් විය.

- විමර්ශන කටයුතු සඳහා තොරතුරු රැස් කිරීමේ අභියෝග: අදාළ රජයේ ආයතනවලින් අත්‍යවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ දී කොමිෂන් සභාව සැලකිය යුතු ප්‍රමාදයන්ට මුහුණ දෙයි. අදාළ ප්‍රසම්පාදන අස්තිත්වවලින් අසම්පූර්ණ ලියකියවිලි ඉදිරිපත් කිරීම පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය අවසන් කිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයකට හේතු වී ඇති අතර, එය කොමිසමේ තීරණ ගැනීමේ දී අනවශ්‍ය ප්‍රමාදයන් සිදුවීමට හේතු වී ඇත. මෙම ප්‍රමාදයන් කොමිෂන් සභාවේ සමස්ත කාර්යසාධනයට අහිතකර ලෙස බලපා ඇත.
- ප්‍රසම්පාදන කළමනාකරණ අංශ පිහිටුවීමට ප්‍රසම්පාදන අස්තිත්ව අසමත් වීම හේතුවෙන්, කොමිෂන් සභාවට අවශ්‍ය ලියකියවිලි සහ විස්තර නියමිත වේලාවට ලබා ගැනීමේ දී ප්‍රමාදයන් ඇති වී තිබේ. මෙය 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රසම්පාදනවල අපේක්ෂිත ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයන්ට ද හේතු වී තිබේ.

2.1.4 ඉදිරි ඉලක්ක

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සඳහා සකස් කරන ලද ආයතනික සැලැස්මට අනුව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2025 වසරෙන් ඔබ්බට සපුරාගත යුතු ඉලක්ක පහත පරිදි වේ:

2.1.4.1 පහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිකුත් කිරීම මඟින්, ප්‍රශස්ත රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ පටිපාටි සකස් කිරීම:

අ) උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

ආ) ඖෂධ සහ වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

ඇ) කොන්ත්‍රාත් කළමනාකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

ඈ) තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

ඉ) ලංසුකරුවන්ගේ මාර්ගෝපදේශය

ඊ) වත්කම් බැහැර කිරීම (ඉඩම්) පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

උ) ජාත්‍යන්තර තරගකාරී ලංසු (භාණ්ඩ), ජාතික තරගකාරී ලංසු (භාණ්ඩ), ජාතික තරගකාරී ලංසු (සේවා) සහ සාප්පු සවාරි ක්‍රියා පටිපාටිය (භාණ්ඩ) සඳහා සම්මත ලංසු ලේඛන (SBD)

ඌ) රාමු ගිවිසුම, ජීවන චක්‍ර පිරිවැය, PMD ස්ථාපිත කිරීම සහ මුදලට සරිලන වටිනාකම පිළිබඳ මාර්ගෝපදේශ සටහන්.

2.1.4.2 පූර්ණ ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම

2.1.4.3 රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළ විමර්ශන: අවම කාල රාමුවක් තුළ අදාළ සියලු ප්‍රසම්පාදන සම්බන්ධ පැමිණිලි කාර්යක්ෂමව විසඳීම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ප්‍රසම්පාදන අස්තිත්ව ප්‍රධානීන් කාලෝචිත හා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම සහ විමර්ශන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා අතිරේක විමර්ශන නිලධාරීන් බඳවා ගැනීම.

2.1.4.4 රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

අ) පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් (දෙවන අදියර)

ආ) රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

2.1.4.5 ආයතනික ධාරිතා සංවර්ධනය.

03 වන පරිච්ඡේදය

සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2025 වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පහත පරිදි වේ:

විස්තරය	සටහන	තත්‍ය	
		2025 රු.	2024 රු.
ආදායම් ලැබීම්			
ආදායම් බද්ද	-	-	-
දේශීය භාණ්ඩ හා සේවා බදු	-	-	-
ජාත්‍යන්තර වෙළඳාම සඳහා බදු	-	-	-
බදු නොවන ආදායම් සහ අනෙකුත්	-	-	-
මුළු ආදායම් ලැබීම් (අ)		-	-
ආදායම් නොවන ලැබීම්		**-**	-
භාණ්ඩාගාර අග්‍රිම	-	136,046,000	85,833,000
තැන්පතු	-	4,921,848	3,534,648
අත්තිකාරම් ගිණුම	-	1,833,200	635,594
වෙනත් ප්‍රධාන ලෙජර් ලැබීම්	-	-	-
ආදායම් නොවන මුළු ලැබීම්		**142,801,048**	**90,003,242**
මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් (ඇ) = (අ) + (ආ)		**42,801,048**	**90,003,242**
භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණ (ඈ)		**-**	-
ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් (ඉ) = (ඇ) - (ඈ)		142,801,048	90,003,242
අඩුකළා: වියදම්			
පුනරාවර්තන වියදම්			
වේතන, වැටුප් හා වෙනත් සේවක ප්‍රතිලාභ	**5**	39,951,553	28,354,900
වෙනත් භාණ්ඩ හා සේවා	**6**	23,071,682	20,067,743
සහනාධාර, ප්‍රදාන හා පැවරුම්	**7**	112,469	80,372
පොළී ගෙවීම්	**8**	-	-
වෙනත් පුනරාවර්තන වියදම්	**9**	375,923	176,224
පුනරාවර්තන වියදම් එකතුව (ඊ)		**63,511,626**	**48,679,239**
ප්‍රාග්ධන වියදම්			
ප්‍රධාන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	**10**	57,872,687	39,336,702
ප්‍රධාන වත්කම් අත්පත් කර ගැනීම	**11**	13,234,387	733,211
ප්‍රාග්ධන මාරු කිරීම්	**12**	-	-
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-
ධාරිතා වර්ධනය	**14**	150,604	-

අනෙකුත් ප්‍රාග්ධන වියදම්	15	1,927,951		1,286,896
ප්‍රාග්ධන වියදම් එකතුව (උ)		**73,185,630**		**41,356,809**
තැන්පතු ගෙවීම්	-	4,695,002		333,130
අත්තිකාරම් ගෙවීම්	-	3,812,459		2,616,946
අනෙකුත් ප්‍රධාන ලෙජර් ගෙවීම්		-		-
මුළු ප්‍රධාන ලෙජර් වියදම (ඌ)		**8,507,461**		**2,950,076**
මුළු වියදම එ = (ඊ+උ+ඌ)		**145,204,717**		**92,986,124**
දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(2,403,669)**		**(2,982,883)**
අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට අනුව ශේෂය		(2,403,669)		(2,982,883)
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		-
		(2,403,669)		**(2,982,883)**

3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ:

විස්තරය	සටහන	තත්‍ය		
		2025 රු.		2024 රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත, හා උපකරණ	**ACA-6**	76,724,087		44,065,294
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	**ACA-5/5(a)**	3,960,611		1,735,122
මුදල් හා මුදල් හා සමාන වත්කම්	**ACA-3**	0		0
මුළු වත්කම්		**80,684,698**		**45,800,416**
ශුද්ධ වත්කම්/ස්කන්ධ				
භාණ්ඩාගාරයට යැවූ ශුද්ධ අගය		532,248		(1,466,395)
දේපළ, පිරියත, හා උපකරණ සංචිතය		76,724,087		44,065,294
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ACA-5(b)**			

ජංගම වගකීම්				
තැන්පත් ගිණුම්	**ACA-4**	3,428,363		3,201,517
නොපිය වූ අග්‍රිම ශේෂය	**ACA-3**	0		0
මුළු වගකීම්		**80,684,698**		**45,800,416**

3.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පහත පරිදි වේ:

විස්තරය	තත්‍ය	
	2025 රු.	**2024** රු.
මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රවාහ		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් රැස් කළ ආදායම්	2,235,151	1,112,167
අග්‍රිම ලැබීම්	136,046,000	85,833,000
අත්තිකාරම් පියවීම්	2,337,139	1,011,099
තැන්පතු ලැබීම්	4,921,848	3,534,648
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**145,540,138**	**91,490,914**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	63,374,082	48,598,868
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	112,469	80,371
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන මාරු කිරීම්, ධාරිතා වර්ධනය සහ අනෙකුත් ප්‍රාග්ධන වියදම්	59,951,243	40,998,598
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	167,865	0
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	0	0
අත්තිකාරම් ගෙවීම්	4,005,090	1,121,735
තැන්පත් ගෙවීම්	4,695,002	333,130
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**132,305,751**	**91,132,702**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)	**13,234,387**	**358,212**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		

පොළී	0	0
ලාභාංශ	0	0
හිමිකම් බැහැර කිරීමෙන් හා භෞතික වත්කම් විකිණීමෙන් ලද මුදල්	0	0
උප-ණය අයකර ගැනීම්	0	0
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඈ)	**0**	**0**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	13,234,387	358,212
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**13,234,387**	**358,212**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) - (ඉ)	**(13,234,387)**	**(358,212)**
	0	**0**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම	0	0
විදේශීය ණය ගැනීම්	0	0
ප්‍රදානයන් ලැබීම	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**0**	**0**
අඩු කළා - මුදල් වැය කිරීම:		
දේශීය ණය ආපසු ගෙවීම්	0	0
විදේශීය ණය ආපසු ගෙවීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) – (එ)	**0**	**0**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) – (ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම වාර්තාවේ අවසන් විගණනය කරන ලද පිටපතෙහි ඇතුළත් කරනු ඇත.

3.5 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය අදාළ නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	මුල් ප්‍රතිපාදනය ("000)	අවසන් ප්‍රතිපාදනය ("000)	තත්‍ය පිරිවැය ("000)	උපයෝගීතාව %
පුනරාවර්තන	86,700	86,700	63,511	73.25%
ප්‍රාග්ධන	135,300	135,000	73,186	54.09%

3.7 වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මඟින් ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මඟින් ප්‍රදානය කරන ලද **ප්‍රතිපාදන** පිළිබඳ විස්තර අදාළ නොවේ.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	විස්තරය	2024.12.31 දිනට ශේෂය	2025.12.31 දිනට ශේෂය	ගිණුම්ගත කිරීමට	ප්‍රගතිය %
9152	යන්ත්‍රසූත්‍ර	44,065,293.93	76,724,086.67	-	100%

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/C/NPC/2/25/17 මබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

ශීර්ෂය 024 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 024 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි

2

සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව 2025 වර්ෂයේදී වියදම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 16 ක එකතුව රු.18,459,264 ක් සහ මූලධන වැය විෂයයන් 05 ක එකතුව රු.61,348,757 ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 02 කට සලසා තිබුණු එකතුව රු.3,200,000 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) වැය විෂයයක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.205,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මු.රෙ.66 යටතේ මාරුකරගෙන තිබුණි. එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 103 ක් වී තිබුණි.

3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

2023 නොවැම්බර් 07 දිනැති අංක 03/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව මු.රෙ.506(ඩී) ප්‍රකාර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් ආකෘති අංක 01 යටතේ 2025 දෙසැම්බර් 31 දිනට වාර්ෂික සැසඳුම් ප්‍රකාශයෙහි හර ශේෂය රු.3,649,303 ක් වුවද එය රු.1,667,951 ක් ලෙස දක්වා තිබුණි.

3.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය	අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබූ අතර විගණන සහ කළමනාකරණ කමිටුද පිහිටුවා නොතිබුණි.
(ආ) 2024 මැයි 06 දිනැති අංක HD/H/G/B/2020/B90 දරන රාජ්‍ය සේවා, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය	කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන යන රජයේ බංගලා නිවාසය සහ ඉඩම් කොටස, කොමිෂන් සභාව වෙත නිදහස් කිරීම සඳහා එකඟතාව ලබාදී තිබුණද, 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කර නොතිබුණි.
(ඇ) 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය වියදම් පාලනය පිළිබඳ ජාතික අයවැය චක්‍රලේඛයේ 5.1 වගන්තිය	කාර්ය මණ්ඩල සඳහා දේශීය පුහුණු අවස්ථා ලබා දීමේදී සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව, ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කල යුතු අනිවාර්යය පුහුණුවීම සඳහා පමණක් පුහුණු අවස්ථා ලබා දිය යුතු වුවද යොමුගත චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේදී පුහුණු ආයතනයකට රු.75,000ක් ගෙවා නිලධාරියකු හට ඩිප්ලෝමා පුහුණුවක් ලබා දී තිබුණි.

4

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව 2023 මැයි 04 දින ආරම්භ කර තිබුණි.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රශස්ත භාවිතයන් සම්පාදනය කිරීම, ප්‍රසම්පාදන අස්ථිත්වයන්හි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම, ප්‍රසම්පාදන අස්ථිත්වයන්හි මෙන්ම එක් එක් ප්‍රසම්පාදනයෙහි කාර්යසාධනය සම්බන්ධයෙන් සුදුසු බලධාරීන් වෙත වාර්තා කිරීම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉටු කළ යුතු ක්‍රියාකාරකම් පිළිබඳව ඉදිරිපත්කර තිබූ සැලැස්ම අනුව හා 2025 දෙසැම්බර් 31 දිනට එම ක්ෂේත්‍රවලට අදාලව ඉදිරිපත් කරන ලද ප්‍රගතිය අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන ප්‍රතිපත්ති අංශය

(i) භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා මාධ්‍ය 03ම ඇතුලත්ව 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල චක්‍රලේඛය නිකුත් කර තිබුණු නමුත් ඒ සඳහා වන අත්පොත දෙමළ භාෂා මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(ii) උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශන සංග්‍රහය සමාලෝචිත වර්ෂය තුලදී නිකුත් කිරීමට නියමිතව පැවතුනද, 2025 දෙසැම්බර් 31 දින වන විට එය පරිවර්තන අදියරේ ද ඊට අදාල අත් පොත කෙටුම්පත් අදියරේද පැවතුණි.

(iii) කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය, 2024 දෙසැම්බර් 31 දින වන විට මූලික කෙටුම්පත සම්පූර්ණ කර සමාලෝචන අවස්ථාවේ පැවතුණු අතර එය 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම තත්ත්වයේම පැවතුණි.

(iv) ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය යටතේ පළමු කෙටුම්පත සකස් කර සමාලෝචන අදියරෙහි පැවතුණු අතර එය 2025 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් වැඩිදියුණු කරමින් පැවතුණි.

(v) රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා වන පනත, 2024 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය යටතේ පළමු කෙටුම්පත සකස්කර සමාලෝචන අදියරෙහි පැවතුණු අතර 2025 දෙසැම්බර් 31 දින වන විටත් එය එම තත්ත්වයේම පැවතුණි.

(vi) රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදනය (e-Gp) සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වන කෙටුම්පත 2025 දෙසැම්බර් 31 දින වන විටත් සමාලෝචන අදියරේ පැවතුණි.

(vii) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පනතට අදාල කෙටුම්පත සඳහා කොමිෂන් සභාවේ මතය NAPP වෙත ලබා දී තිබුණ අතර පනත අනුමත වූ පසුව මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට නියමිතව තිබුණි.

5

(viii) රජයේ වත්කම් කළමනාකරණය සහ අපහරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම 2025 දෙසැම්බර් 31 දින වන විට ද සිදු කෙරෙමින් පැවතුණි.

(ix) රජය සතු දේපළ බැහැර කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශය 2025 දෙසැම්බර් 31 දක්වා ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(x) සම්මත ලංසුලේඛන සංවර්ධනය සඳහා 2025 දෙසැම්බර් 31 දින වන විට උපදේශක සේවා ලබා ගනිමින් අදාල කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

(ආ) ප්‍රසම්පාදන විමර්ශන අංශය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියාපටිපාටි වලින් බැහැරව රාජ්‍ය ආයතන විසින් සිදුකරන ලද ප්‍රසම්පාදන පිළිබඳ කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි පිළිබඳව 2025 දෙසැම්බර් 31 දිනට විමර්ශනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(i) සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ විමර්ශනය සඳහා පැවති පැමිණිලි සංඛ්‍යාව 135 ක් විය. එයින් පැමිණිලි 87 ක් විමර්ශන අවසන් කර තිබූ අතර එම ප්‍රමාණය විමර්ශන සිදු කිරීම සඳහා පැවති පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 64 ක් විය.

(ii) 2025 දෙසැම්බර් 31 දින වන විට විමර්ශන අවසන් කර ලද පැමිණිලි 87 න් පැමිණිලි 77 කට අදාලව කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී අදාළ ආයතන/පාර්ශ්වයන් වෙත දැනුම් දී තිබුණු අතර ඉතිරි පැමිණිලි 10 ක් සම්බන්ධව කොමිෂන් සභාව විසින් තීරණ ලබා දීම හා අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම 2026 වර්ෂයේ ජනවාරි මාසයේදී සිදු කර තිබුණි.

(iii) 2025 දෙසැම්බර් 31 දින වන විට විමර්ශන සිදු නොකරන ලද පැමිණිලි සංඛ්‍යාව 47ක් වූ අතර මෙම පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභාව විසින් අදාළ අමාත්‍යාංශ වෙතින් තොරතුරු ඉල්ලීම් සිදුකර තිබුණ ද අදාළ තොරතුරු ලැබී නොතිබුණි. මෙම තොරතුරු ලැබී නොමැති පැමිණිලි අතරින් 2024 වර්ෂයේ ලද පැමිණිලි 03 ක්ද විය.

4.2 විදේශ ආධාර ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතනවල රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් ලබාදුන් තාක්ෂණික හා මූල්‍ය ප්‍රදාන යටතේ සහාය ලබාගනිමින් විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් (Electronic Procurement Monitoring System – ePMs) සැකසීමේ කටයුතු ආරම්භ කර තිබුණි. මේ පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 37 වන වගන්තිය ප්‍රකාරව ගිවිසුම් අත්සන් කර ප්‍රදාන ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය අස්තිත්වයකට ලිඛිතව බලය පවරනු ලැබ ඇති අවස්ථාවලදී හැර අමාත්‍ය මණ්ඩලයේ අවසරයට යටත්ව විදේශීය රාජ්‍ය හෝ ජාත්‍යන්තර සංවිධාන සමඟ විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් සියලු ගිවිසුම් අත්සන් කිරීමට හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශීය දායකත්වයෙන් ප්‍රදාන ලබා ගැනීමට භාණ්ඩාගාරයේ ලේකම්ට බලය ඇති

බව දක්වා තිබුණි. එසේ වුවද UNDP ප්‍රදාන යටතේ මෙම විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සැකසීම පිළිබඳව පහත තොරතුරු විගණනයේදී තහවුරු නොවිය.

(i) UNDP ප්‍රදාන යටතේ මෙම පද්ධතිය සැකසීමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය
එසේ වුවද ප්‍රසම්පාදන කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවරා ඇති මූලික කාර්යයන් ඉටු කිරීම සඳහා මෙම විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) නිර්මාණය කර ඇති බවත්, ඒ අනුව මෙවැනි පද්ධතියක් සැකසීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස පිහිටුවා ඇති ආයතනයක කාර්යයන්හි ස්වාධීනත්වයට බලපෑමක් ඇති කිරීමට අවස්ථාවක් වන බැවින් එසේ කිරීම අවශ්‍ය නොවන බව විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ii) UNDP ප්‍රදාන මුදල, ප්‍රදානය කරනු ලබන වත්කම්, ව්‍යාපෘති කාල සීමාව, ව්‍යාපෘතිය ආරම්භක දිනය, අවසාන දිනය, පද්ධතිය සැකසීමට අදාල සේවාදායකින් වෙත ගෙවීම් කරන ආකාරය කාලරාමු සහිත ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාකාරී සැලැස්ම, පද්ධතිය ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීමට අදාල කාර්ය පටිපාටි හා වෙනත් විධිවිධාන ඇතුලත් කරමින් UNDP ආයතනය සමඟ එකඟතාවයකට එළඹී ගිවිසුම
එසේ වුවද මෙම විද්‍යුත් අධීක්ෂණ පද්ධතිය සැකසීම හා එහි සංවර්ධන කටයුතු වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් උපදේශකවරයෙකු හා සංවර්ධකයෙකු සපයා දී තිබූ අතර එම උපදේශකවරයා විසින් පද්ධතිය සැලසුම් කිරීමට අදාලව වාර්තාවක් (High – level Conceptual design and implementation requirements) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අදාල සංවර්ධන සමාගම විසින් පද්ධතිය සඳහා අවශ්‍ය දෘඩාංග හා මෘදුකාංග හඳුනාගෙන පද්ධතියේ සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

(ආ) කොමිෂන් සභාව විසින් 2025 ඔක්තෝම්බර් අවසන් වන විට නියමු අදියර ක්‍රියාත්මක කිරීම අවසන්කල යුතු බව දක්වමින් පද්ධතියට අදාලව සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද මෙම විද්‍යුත් අධීක්ෂණ පද්ධතියේ සමස්ථ සංවර්ධන අදියරයන් හා එහි කාල වකවානු කුමක්ද යන්නත්, එම එක් එක් අදියරයන් සඳහා කොපමන රාජ්‍ය ආයතන සංඛ්‍යාවක් පද්ධතියට සම්බන්ධ කර ගන්නේද යන්න පිළිබඳව කොමිෂන් සභාව සතුව නිශ්චිත කාල රාමු සහිත සමස්ථ ක්‍රියාවලියට අදාල විස්තරාත්මක සැලැස්මක් නොතිබුණි.

(ඇ) තොරතුරු තාක්ෂණ පාදක අන්තර් ක්‍රියාකාරී ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් (ePMS) ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2025 ඔක්තෝම්බර් 31 දින දක්වා නියමු අවධියේ ක්‍රියාත්මක විය යුතු පද්ධතිය තුලට ප්‍රසම්පාදන සැලැසුම් ඇතුලත් කර යාවත්කාලීන කිරීම සඳහා අමාත්‍යාංශ 24 ක් ස්වාධීන ආයතන 18 ක් වශයෙන් මුළු රාජ්‍ය ආයතන 42 ක් වෙත 2025 ඔක්තෝබර් 31 දින වන විට තොරතුරු ඇතුලත් කිරීමට උපදෙස් ලබාදී තිබුණද, 2025 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යය ඉටුකර තිබුණේ රාජ්‍ය ආයතන ආයතන 08 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී මෙම අධීක්ෂණ පද්ධතියේ නියමු අදියර ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

7

(ඇ) අධීක්ෂණ පද්ධතියේ නියමු අදියර අපේක්ෂිත පරිදි සිදු නොවූ බැවින් 2025 වර්ෂයේදී ePMS සම්බන්ධව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කල ජාතික ප්‍රසම්පාදන සැලැස්ම සංවර්ධනය කිරීම, ප්‍රසම්පාදන අධීක්ෂණ සඳහා මෙහෙයුම් අත්පොතක් සකස් කිරීම, නියැදි පදනම මත ප්‍රසම්පාදන අස්ථිත්වල පූර්ව සමාලෝචන සහ පසු සමාලෝචන සිදු කිරීම සහ ප්‍රසම්පාදන අස්ථිත්වයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ මාසික, කාර්තුමය හා වාර්ෂික කාර්යසාධන වාර්තා ePMS තුලින් ජනනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) කොමිෂන් සභාව විසින් පද්ධතිය සැකසීමේ කටයුතු ආරම්භකර නියමු අවධියේ (Pilot Stage) ක්‍රියාත්මකව පැවතියද පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට හා ප්‍රසම්පාදන අධීක්ෂණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය මානව සම්පත් හඳුනාගෙන අදාල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2025 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ එක් අධ්‍යක්ෂකවරයෙකු හා එක් සංවර්ධන නිලධාරියෙකු පමණක් සේවයේ නිරතව සිටින බව නිරීක්ෂණය විය.

(ඊ) පද්ධතිය සංවර්ධනය කරන ලද සමාගම මගින් පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා ප්‍රසම්පාදන අධීක්ෂණ කාර්යයන් පිළිබඳව අදාල කාර්ය මණ්ඩලයට පුහුණුවක් ලබාදීම සිදුකල යුතු වුවද, කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා නිලධාරීන් පුහුණුකර පද්ධතිය යාවත්කාලීනව, කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(උ) රාජ්‍ය ආයතන විසින් වෙළෙඳපල මිල සැඳහුම් ක්‍රමය (Shopping Method) යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනයේදී යොදාගනු ලබන රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය, විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS) සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කල යුතු වුවද, 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඒ පිළිබඳව සාකච්ඡා මට්ටමේ පමණක් පැවතුණි.

(ඌ) ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ මෙහෙයුම් ධාරිතාව ඉහල නැංවීම සඳහා එකතුව රු.8,030,372 ක වටිනාකමෙන් යුතු තාක්ෂණික උපකරණ 39ක් UNDP විසින් කොමිෂන් සභාව වෙත ලබාදී තිබුණද, මෙම උපකරණවලින් ප්‍රසම්පාදන අධීක්ෂණ අංශයේ කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණේ මුද්‍රණ යන්ත්‍ර 02 ක් හා ඩෙස්ක්ටොප් යන්ත්‍ර 02 ක් පමණි. ඉතිරි උපකරණ සියල්ල සාමාජිකයන්ගේ අනෙකුත් අංශවල පරිහරණය සඳහා ලබා දී තිබුණු අතර ලැප්ටොප් පරිගණකයක් භාවිතයකින් තොරව ගබඩාවේ පැවතුණි.

4.3 ප්‍රසම්පාදනයන්

2025 ජනවාරි 01 දින සිට බලාත්මක වන 2024 භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා පිලිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 04 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති ඇමුණුම්හි සඳහන් ආකෘතීන්ට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සකස්කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP), සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (DAPP), පූර්ව සූදානම් සැලැස්ම (PP) සහ ප්‍රසම්පාදන කාලසටහන (PTS) සමාලෝචිත වර්ෂයේදී විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

4.4.1 පුහුණු වැඩසටහන් පැවැත්වීම

(අ) පුහුණුකරුවන් පුහුණුකිරීමේ (TOT) වැඩසටහන යටතේ ජාතික මට්ටමේ එක වැඩසටහනක් සහ පළාත් මට්ටමේ වැඩසටහන් හතක් ලෙස මුළු වැඩසටහන් අටක් සමාලෝචිත වර්ෂය තුල පැවැත්වීමට සැලසුම් කර තිබුණද එයින් වැඩසටහන් 05 ක් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ අත්පොත - 2024 සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා විවිධ ආයතන විසින් කරන ලද ඉල්ලීම් ලිපි අනුව ආයතන 08 ක එවැනි ඉල්ලීම් ඉටුකර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2025 වර්ෂය සඳහා මානව සම්පත් සැලසුමෙහි වූ මානව සම්පත් සංවර්ධන දින දර්ශනයට අනුව ලබා දීමට සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් 09 න් වැඩසටහන් 03 ක් පවත්වා නොතිබුණි.

5.2 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2025 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 09 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 01 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 16 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් විය. මෙම තත්ත්වය සභාවේ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ) බඳවාගැනීමේ පටිපාටිය අනුව ස්ථිර සේවයට පත් කර ගැනීම වෙනුවට ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් අනුයුක්ත කර තිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 වන පරිච්ඡේදය: කාර්යසාධන දර්ශක

4.1 කොමිෂන් සභාවේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වී ඇත)

නිශ්චිත දර්ශක	100% — 90%	75% — 89%	50% — 74%
කාර්යාල පුළුල් කිරීම භූමි අලංකරණය	√		 √
කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය සහ ජාලකරණය	√		
ප්‍රසම්පාදන සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම			√
2025 - 2026 සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම	√		
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් නිකුත් කිරීම;			
• භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා අත්පොත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් නිකුත් කිරීම	√		
• උපදේශකයින් තෝරා ගැනීම සහ රැකියාවේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ සහ අත්පොත		√	
• කොන්ත්‍රාත් කළමනාකරණ මාර්ගෝපදේශ			√
• ඖෂධ සහ වෛද්‍ය උපකරණ සඳහා මාර්ගෝපදේශ		√	
• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පිළිබඳ මාර්ගෝපදේශ *			

භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා පිළිබඳ මාර්ගෝපදේශ: • දැනුම්වත් කිරීම හා මාර්ගෝපදේශ හා අත්පොත් බෙදාහැරීම	√		
රාජ්‍ය ප්‍රසම්පාදන පනත් කෙටුම්පත සකස්කිරීම		√	
e-GP මාර්ගෝපදේශ නිකුත් කිරීම**			
පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීම; • 2024 නව මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්; • TOT වැඩසටහන් පැවැත්වීම; • පුහුණු ද්‍රව්‍ය සංවර්ධනය කිරීම. • අභ්‍යන්තර නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය	√		
ඵලදායී ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම		√	
ජාතික ප්‍රසම්පාදන සැලැස්ම සංවර්ධනය කිරීම			√
ප්‍රසම්පාදන අධීක්ෂණ සඳහා මෙහෙයුම් අත්පොතක් සකස් කිරීම***			
ප්‍රසම්පාදන අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිලි ලබා ගැනීම සහ විමර්ශනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම • අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම	√		
රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය****			

*රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කර නොමැති බැවින්, මෙම මාර්ගෝපදේශ සකස් කිරීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට හැකියාවක් නොමැත.

**මෙහෙයුම් මාර්ගෝපදේශ/අත්පොත සකස් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යටතේ ඇති e-GP ඒකකය වගකිව යුතු බැවින්, එය ලැබුණු පසු මාර්ගෝපදේශ/අත්පොත නිකුත් කිරීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට හැකි වනු ඇත.

***අපේක්ෂිත පරිදි එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් සහාය ලැබීමෙන් පසු මෙහෙයුම් අත්පොතක් නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

**** ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සීමිත වීම මත මෙම කාර්යය ඉටුකර නොතිබුණි.

05 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	0%—49%	50%—74%	75%—100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම තුළින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පහත සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට දායක වී ඇත:

ජයග්‍රහණ

ආර්ථික සංවර්ධනය (SDG 1 සහ SDG 8)

දේශීය කර්මාන්තවලට සහාය වීම, විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහ මුදලට සරිලන වටිනාකම පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීම මඟින් ජාතික ආර්ථික සංවර්ධනය වෙනුවෙන් මැනවින් ව්‍යුහගත රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියක් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. උපායමාර්ගික ප්‍රසම්පාදන මූලපිරීම් - විශේෂයෙන් යටිතල පහසුකම් සහ ආයතනික සංවර්ධනය තුළ - රැකියා නිර්මාණය උත්තේජනය කරන අතර තිරසර, සියල්ල ඇතුළත් ආර්ථික වර්ධනයට පහසුකම් සපයයි.

යටිතල පහසුකම් සහ නවෝත්පාදන සංවර්ධනය (SDG 9)

දැරිය හැකි යටිතල පහසුකම් සංවර්ධනය සහ නවෝත්පාදන පෝෂණය තුළින් තිරසර සංවර්ධන ඉලක්ක 9 සපුරා ගැනීම සඳහා කාර්යක්ෂම ප්‍රසම්පාදන පිළිවෙත් සැලකිය යුතු දායකත්වයක් සපයයි. ඵලදායිතාව ඉහළ නැංවීම සහ නවීන ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීම තුළින්, ශ්‍රී ලංකාවේ දිගුකාලීන කාර්මික තරගකාරිත්වය සහ තිරසර ආර්ථික ප්‍රගතිය සඳහා ශක්තිමත් පදනමක් නිර්මාණය කිරීමට මෙම පද්ධතිය උපකාරී වේ.

තිරසාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම (SDG 12)

පාරිසරික වශයෙන් වගවන මිලදී ගැනීම්, අපද්‍රව්‍ය අවම කිරීම සහ කාර්යක්ෂම සම්පත් භාවිතාව සහතික කිරීම මගින් තිරසර සංවර්ධන ඉලක්ක 12 සපුරා ගැනීමට තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය මග පාදයි. මෙම ප්‍රවේශය තුළින් රාජ්‍ය අංශය පුරා වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදන රටා ප්‍රවර්ධනය කරන අතරම දිගුකාලීන ආර්ථික, පාරිසරික සහ සමාජීය ප්‍රතිලාභ උදාකරයි.

පාරිසරික ආරක්ෂාව (SDG 13)

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සියලු අදියරවල දී පාරිසරික කරුණු සලකා බැලෙන ශක්තිමත් ප්‍රසම්පාදන රාමුවක් මඟින් දේශගුණික විපර්යාස මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග සඳහා විශාල දායකත්වයක් සැපයේ. තිරසර ද්‍රව්‍ය, බලශක්ති-කාර්යක්ෂම සැලසුම් සහ පරිසර හිතකාමී ඉදිකිරීම් පිළිවෙත් වැනි හරිත ඉදිකිරීම් ප්‍රමිතීන් අනුගමනය කිරීමට මෙන්ම, ස්වාභාවික සම්පත් ආරක්ෂා කරන අතරම අවම කාබන් සහ දේශගුණික-ප්‍රතිරෝධී ආර්ථිකයක් කරා සංක්‍රමණය වීමට ශ්‍රී ලංකාවට උපකාරී වේ.

යහපාලනය සහ විනිවිදභාවය (SDG 16)

විනිවිද පෙනෙන සහ තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලීන් තුළින් දූෂණ අවදානම් අවම කිරීම, රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සහ වගවීම දැඩි කිරීම මගින් යහපාලනය ශක්තිමත් කිරීම සිදුවේ. සාධාරණ, විවෘත සහ මැනවින් නියාමනය කරන ලද ප්‍රසම්පාදන පරිසරයක් තුළ කාර්යක්ෂමව සම්පත් වෙන්කර දීම තහවුරු වන අතර තිරසර සංවර්ධන ඉලක්ක අංක 16 සාක්ෂාත් කර ගැනීමට එය සෘජුව සහාය වේ.

අභියෝග

ආර්ථික සංවර්ධනය (SDG 1 සහ SDG 8)

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයන්, සීමිත වෙළඳපල තරගකාරිත්වය සහ මුදලට සරිලන වටිනාකමක පිළිබඳ මූලධර්මය ඒකාකාරීව අනුගමනය නොකිරීම යනාදිය ආර්ථික වර්ධනය වෙනුවෙන් පද්ධතියේ දායකත්වය කෙරෙහි බාධා ඇති කරයි. දුර්වල ආයතනික ධාරිතාව සහ දේශීය කර්මාන්ත සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොමැතිකම දරිද්‍රතාවය අඩු කිරීමේ සහ තිරසර රැකියා උත්පාදනයේ ප්‍රගතිය තවදුරටත් සීමා කරයි.

යටිතල පහසුකම් සහ නවෝත්පාදන සංවර්ධනය (SDG 9)

යල් පැන ගිය තාක්ෂණික පිරිවිතර, සීමිත නවෝත්පාදන කේන්ද්‍ර කරගත් ප්‍රසම්පාදන නිර්ණායක සහ ප්‍රමාණවත් නොවන දිගුකාලීන යටිතල පහසුකම් සැලසුම් ප්‍රධාන අභියෝග අතර වේ. පර්යේෂණ සඳහා ආයෝජන සීමිත වීම සහ නැගී එන තාක්ෂණ භාවිතාව මන්දගාමී වීම ඔරොත්තු දියහැකි, නවීන සහ නව්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට බාධා කරයි.

තිරසර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම (SDG 12)

දැනුම්වත්බව අවම වීම, පරිසර හිතකාමී නිෂ්පාදනවල ලබා ගැනීමේ හැකියාව සීමිත වීම සහ හරිත විකල්පවල මූලික පිරිවැය අධික වීම මගින් තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාත්මක කිරීමට දරන ප්‍රයත්න සීමා වේ. ප්‍රමිතිගත තිරසර නිර්ණායක නොමැතිකම සහ ප්‍රමාණවත් නොවන අධීක්ෂණ යාන්ත්‍රණ වගකිවයුතු පරිභෝජන රටා කරා මාරුවීම තවදුරටත් මන්දගාමී කරයි.

පාරිසරික ආරක්ෂණය (SDG 13)

පාරිසරික ප්‍රමිතීන් අනුගමනය දුර්වල වීම, සීමිත තාක්ෂණික විශේෂඥතාව සහ හරිත ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීම් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් තුළට දේශගුණික සලකා බැලීම් ඒකාබද්ධ කිරීමට සැලකිය යුතු බාධක ඇති කරයි. අයවැය සීමාවන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ඒකාකාරීව සිදු නොවීම පාරිසරික ආරක්ෂණයේ ධාවකයක් වන ප්‍රසම්පාදනයේ කාර්යක්ෂමතාව තවදුරටත් අඩු කරයි.

යහපාලනය සහ විනිවිදභාවය (SDG 16)

අක්‍රමවත් ප්‍රසම්පාදන පිළිවෙත්, ප්‍රමාණවත් නොවන අධීක්ෂණ පද්ධති සහ දේශපාලන මැදිහත්වීම් විනිවිදභාවය සහ වගවීම අඩපණ කරයි. දුර්වල වාර්තාකරණ ව්‍යුහයන්, සීමිත විගණන ධාරිතාව සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිවලට නොගැලපෙන ලෙස අනුගත වීම දූෂණ අවදානම් ඉහළ නංවන අතර ප්‍රසම්පාදන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය පළුදු කරයි.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ:

අංක	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	සේවයේ යෙදී සිටින	පුරප්පාඩු
1	මහ ලේකම්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL-3	1	1	0
2	අතිරේක ලේකම්	ශ්‍රී.ලං.ප.සේ.	විශේෂ	SL-3	1	0	1
3	ප්‍රසම්පාදන විශේෂඥ	විවෘත	විශේෂ	SL-3	3	0	3
4	අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	I	SL-1	2	2	0
5	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.	III/II	SL-1	2	0	2
6	අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ඉ.සේ.	I	SL-1	1	1	0
7	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ඉ.සේ.	III/II	SL-1	1	1	0
8	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.	I	SL-1	1	1	0
9	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.	III/II	SL-1	2	1	1
10	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	III/II	SL-1	1	0	1
11	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.තො.තා.සේ.	III/II	SL-1	1	0	1
12	සභාපතිනියගේ සම්බන්ධීකරණ නිලධාරි	තාවකාලික	—	රා.පරි. චක්‍රලේඛ 10/2025	1	1	0

13	මහ ලේකම්ගේ සම්බන්ධීකරණ නිලධාරි	තාවකාලික	—	රා.පරි. චක්‍රලේඛ 10/2025	1	1	0
14	පරිපාලන නිලධාරි	ක.සේ.නි.සේ.	අධි ශ්‍රේණිය	MN-7	1	1	0
15	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය	I	MN-6	1	1	1
16	තො.සං.තා. නිලධාරි	ශ්‍රී.ලං.තො.තා.සේ.	2/II/I ශ්‍රේණිය	MN-6	1	0	1
17	සංවර්ධන නිලධාරි	සංවර්ධන නිලධාරි සේවය	III/II/I	MN-4	20	6	14
18	කළමනාකරණ සේවා නිලධාරි	කළමනාකරණ සේවා නිලධාරි සේවය	III/II/I	MN-2	8	6	2
19	රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	III/II/I විශේෂ	PL-3	6	3	3
20	කාර්යාල සේවක	කාර්යාල සේවක සේවය	III/II/I විශේෂ	PL-1	5	4	1
ඒකතුව					**60**	**30**	**30**

6.2 මානව සම්පත් හිඟය කොමිෂන් සභාවේ කාර්යසාධනයට ඇති කරන බලපෑම

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යයන්ට සාපේක්ෂව මානව සම්පත් හිඟය එහි සමස්ත කාර්යසාධනයට අහිතකර ලෙස බලපා ඇත. කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩල තනතුරු 60 න්, පුරවා ගැනීමට හැකි වූවේ පුරප්පාඩු 30 ක් පමණකි. එය පුරප්පාඩු සංඛ්‍යාව සමඟ සැසඳීමේදී 50%ක අනුපාතයකි. මෙම සැලකිය යුතු නිලධාරී හිඟය කොමිෂමේ විමර්ශන, අධීක්ෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යයන් කාලෝචිත හා පුළුල් ආකාරයකින් ඉටු කිරීමේ හැකියාවට විශේෂයෙන් බලපා ඇත. එපමණක් නොව, කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් කොමිසමට පර්යේෂණ හා සංවර්ධන ඒකකය ආරම්භ කිරීමට නොහැකි විය.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු වැඩසටහන්

අංක	නම	තනතුර	පුහුණු වැඩසටහන	කාල පරිච්ඡේදය	පැය ගණන	ස්වභාවය	ප්‍රතිදානය/අත්කර ගත් දැනුම
01	එස්.ඩී.එන්.එස්. ජයසේන මහත්මිය	අධ්‍යක්ෂ (පරිපාලන)	රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (ePMS)	දින 01	—	දේශීය	සේවා සැපයීම සඳහා මූලික හා තාක්ෂණික නිපුණතා සංවර්ධනය කිරීම
02	කොමිෂන් සභා කාර්ය මණ්ඩලය	—	කාර්යාල ක්‍රම	දින 01	—	දේශීය	
03	කොමිෂන් සභා කාර්ය මණ්ඩලය	—	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	—	පැය 04	දේශීය	
04	තෝරාගත් නිලධාරීන් පහක් (05)	සංවර්ධන නිලධාරීන්	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා	වර්ෂ 01		දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ මනා දැනුම

විදේශීය පුහුණු වැඩසටහන්

අංක	නම	තනතුර	පුහුණු වැඩසටහන	කාලය	ආයෝජනය (රු. 000)	ස්වභාවය
01	ඩී.සී. සිරිවර්ධන මහතා	මහ ලේකම්	සිංගප්පූරුවේ පැවති 2025 දකුණු ආසියානු මෙහෙයුම් සංසදය (ADB)	2025 සැප්තැම්බර් 21–25	—	විදේශීය

02	ඒ.පී.ඩී.අයි.පී ප්‍රසන්න මහතා	අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)	ස්විච්-ඒෂියා වැඩසටහනේ 7 වන වාර්ෂික රැස්වීම සහ වැඩසටහන් මෙහෙයුම් කමිටු රැස්වීම - තායිලන්තය	2025 ඔක්තෝබර් 26–30	—	විදේශීය
03	පී.ඒ.ඩී. එම්.ඩී. පොන්වීර මහතා	අධ්‍යක්ෂ (අධීක්ෂණ)	ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණය - චීනය	2025 නොවැම්බර් 26 – දෙසැම්බර් 09	—	විදේශීය

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතන පාලනය වන අදාළ මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ නියමයන්ට අනුව පහත සඳහන් අනුකූලතා වාර්තාව සකස් කරනු ලැබ ඇත.

අංක	නියමය	අනුකූලතා තත්ත්වය	(අනුකූල නොවේ නම්) හේතු දැක්වීම	යෝජිත නිවැරදි කිරීමේ පියවර
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.	—	—
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	—	—
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ (ව්‍යාපාර හෝ නිෂ්පාදන ගිණුමක් නැත)	—	—
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ (ගබඩා අත්තිකාරම් ගිණුමක් නැත)	—	—
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ (විශේෂ අත්තිකාරම් ගිණුමක් නැත)	—	—

1.6	වෙනත්	අදාළ නොවේ (වෙනත් ගිණුමක් නැත)	—	—
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙ කර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	—	—
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—

2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.10	බැරකම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම	අනුකූල වේ.	—	—
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුම්වත් කර තිබීම	අනුකූල වේ.	—	—
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.	—	—
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චකු ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.	—	—

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	—	—
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	—	—
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	—	—
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	—	—
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.	—	—
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාළ නොවේ (අභ්‍යන්තර විගණන අංශයක් නැත)	—	—
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර්	අනුකූල වේ.	—	—

	ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම			
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.	—	—
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	—	—
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.	—	—
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.	—	—
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ.	රියදුරු ඉදිරිපත් කළ ධාවන සටහන නිවැරදි නොවේ.	—

9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක් දී අපහරණය කර තිබීම	අනුකූල වේ.	ගර්භිත වාහන නොමැත	—
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.	—	—
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	ඉන්ධන දහනය ප්‍රතිපරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නැත	—
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාළ නොවේ (කල්බදු වාහන නැත)	—	—
10	**ප්‍රතිපාදන උපයෝජනය**			
10.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.	—	—
10.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.	—	—

10.3	රජයේ නිලධාරීන් අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	—	—
11	**සීමාවන්ට අනුකූලවීම**			
11.1	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.	—	—
11.2	වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන ණයහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.	—	—
12	**පොදු තැන්පත් ගිණුම**			
12.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.	—	—
12.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
12.3	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ.	—	—
13	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
13.1	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.	—	—
13.2	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි	අනුකූල වේ.	—	—

	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම			
14	**අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම**			
14.1	**ප්‍රතිපාදන උපයෝජනය**	අනුකූල වේ.	—	—
14.2	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.	—	—
14.3	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.	—	—
14.4	රජයේ නිලධාරීන් අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.	—	—
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	අදාළ නොවේ (ආදායමෙන් ආපසු ගෙවීම් සිදුවී නොමැත)	—	—
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කිරීම	අනුකූල වේ.	—	—
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අදාළ නොවේ (හිඟ ආදායම් වාර්තා නැත)	—	—
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.	—	—
16.3	2017.09.20 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	—	—
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	—	—
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.	—	—
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	—	—
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			

18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.	—	—
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදයේ පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.	—	—
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.	—	—
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.	—	—
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය	අනුකූල වේ (මාණ්ඩලික නිලධාරීන් පමණක් වාර්ෂික	—	—

	සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	කාර්යසාධන ගිවිසුම් අත්සන්කර ඇත)		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරිම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ.	—	—
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.	—	—